# වැරදුණු උපාය



තුෂාරි දේවසුරේන්ද්‍ර

# වැරදුණු උපාය

තුෂාරි දේවසුරේන්ද්‍ර



*වැරදුණු උපාය*

තුෂාරි දේවසුරේන්
කර්තෘ ප්‍රකාශනයකි.


ප්‍රථම මුද්‍රණය : 2025/02/08

කර්තෘ : තුෂාරි දේවසුරේන්ද්‍ර



ලිපිනය : 83/4A,
අම්පිටිය පාර,
මහනුවර.
071-0633346 / 076-6394859



ISBN අංකය : 978-624-208-662-0


වෙනත් කෘති : හරි උපාය - 2023
භාෂාව හා සංස්කෘතිය - 2021


මුද්‍රණය
**"PRESS"**
නො.24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

සැමදා සෙවනැල්ලක් මෙන් මා
පසුපස සිටිනා මාගේ ආදර
දෙමව්පියන්ට
හා
දැනුමෙන් අධ්‍යාපනයෙන් පමණක්
නොව ජීවිත අවබෝධය ලබා දී මා
නිරතුරුව දැනුවත් කල මාගේ
ආදර ඇදුරුතුමන්ට වන
සෙනෙවිරත්න මහලේකම්
වෙත ආදරයෙනි.

# ස්තූතිය

කතාන්දර පොත් ලිවීමට මා හට

නිරතුරු දිරි ගැන්වූ ආදර

සමන්මලී ගුරුතුමියත්

අලංකාර චිත්‍ර ඇඳ දුන් කුඩා දියණිය

නෙතිනි සෙයාරා තල්පගේ

හටත් මගේ හදපිරි තුති මල් පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **''හෙරණගත්කරණී''** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.




කැලයක ලස්සන හාවෙක් හිටියා. මේ අතරේ අහිංසක මුවෙකුත් එතැනට ආවා.




මේ දෙදෙනා හොඳ යාළුවෝ වුණා.



දවසක් කැලයේ ගොදුරු සොයා යන සිංහයෙක් ආවා.




ඉතින් සිංහයා, හාවයි, මුවායි දැකලා අල්ලා ගෙන කන්නට උපායක් හිතුවා.



කොහොම හරි සිංහයා හාවා සහ මුවා එක්ක යාළු වුණා.



යාළුවනි, මේ කැලයේ එහා පැත්තේ හොඳ පළතුරු ගෙඩි හැදෙන පැත්තක් තියෙනවා. අපිත් ඒ පැත්තට යමු කියලා සිංහයා කිවුවා.



දැන් හාවයි, සිංහයයි, මුවයි තුන්දෙනාම කැලේ එහා කෙළවරට යනවා.



ඔන්න කැලේ අතර මැද්දේදී සිංහයා ලොකු වලකට වැටුනා.



ගොඩට එන්න හාවයි, මුවයි උදවු කළා. ලැජ්ජාවෙන් සිංහයා යන්න ගියා.



හොඳට ඉන්න අයට කරදර වෙන්නේ නෑ. හැබැයි නරක වැඩ කරන අයට සුදුසු දඬුවම් ලැබෙනවා.



හාවයි මුවායි දෙන්නා සතුටින් කැලේ ජීවත් වුණා.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුර අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2025-02-08

ISBN අංකය : 978-624-208-662-0